# කෑම පෙට්ටියේ රහස



සෙනුදි දිනන්යා ලොකුසූරිය

**කෑම පෙට්ටියේ රහස**

සෙනුදි දිනන්යා ලොකුසූරිය

ප්‍රථම මුද්‍රණය - 2023

ISBN-978-624-206-691-2

වෙනත් කෘති - පවනිගේ සිහිනය (2020)

# පිදුම

මගේ පොත ලිවීමට උදව් කළ

දෙමව්පියන්, ගුරු මෑණියන්,

වැරදි නිවැරදි කරදුන්

අත්තම්මා ඇතුළු

පවුලේ සැමට...

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් පිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් ත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ගුන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහිත දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවත් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම තත් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්ත මහලේකම්ගේ සේවය ද අගයමි


**ශෂිකලා සේනාධීර විදුහල් පතිනිය මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

2023 10 20

දෙව්හාරි මොනවද ඔය පෙට්ටිය ඇතුලේ තියන්නේ?

ආ... මොනවත් නෑ. දෙව්හාරි උදේ පාසලට පැමිණ වරින් වර කෑම පෙට්ටිය ඇර බලනු දුටු කවීෂා ඇසුවා ය.






මොකද මොකද ඔය කතා කරන්නේ? දෙව්හාරි මොකද ඔය කෑම පෙට්ටිය එළියට අරගෙන, ඇවිල්ලා තියන්න මගේ මේසය උඩ. විවේක කාලය ලැබෙනකන් කෑම කන්න එපා. ගුරුතුමා කිවුවා.

ට්‍රිං...ට්‍රිං...ට්‍රිං... විවේක කාලය ලැබුණා. දෙව්හාරි එක පිම්මේ දුවගෙන ගිහිල්ලා කෑම පෙට්ටිය ගත්තා. ඊටපස්සේ පොත් බෑගය ඇතුලේ තිබුණු කෙසෙල් ගෙඩිය අරගෙන කෑවා.





අනේ ඔයා කෑම ගෙනාවේ නැද්ද? ආ.. මෙන්න කන්න. කියා ලෝචනා පලතුරු ටිකක් දුන්නා.

එපා එපා... මට කෑම තියෙනවා... එහෙනම් ඇයි කන්නේ නැත්තේ? මනුලි ඇහුවා. මට කන්න බෑ, දෙව්හාරි කිවුවා.

විවේක කාලයෙන් පසු දෙව්හාරි සහ ඇයගේ යහළුවන් නැටුම් කාමරය වෙත ගියා. මම මේක කොහෙද තියෙන්නේ...

ම්.... දෙව්හාරි කෑම පෙට්ටිය නැටුම් කාමරයට ද රැගෙන ගියා. අපොයි ඇති, යාන්තම් කවුරුත් දැක්කේ නෑ. දෙව්හාරි ළමයින් නොපෙනෙන විදිහට කෑම පෙට්ටිය රැගෙන පන්තියට ගියා.





ට්‍රිං... ට්‍රිං...ට්‍රිං... පාසල ඇරුණා. දෙව්හාරි කෑම පෙට්ටිය අතේ තබාගෙන ගෙදර ගියා. මගදී කවුදෝ ඇයට කතා කළා.

ඇයි ඔයා ඔය මාළු පැටියාව කෑම පෙට්ටිය ඇතුලේ දාගෙන ආවේ කවීෂා ඇහුවා. ඔයා කොහොමද දැක්කේ? දෙව්හාරි පුදුමයෙන් ඇහුවා. ඔයා නැටුම් කාමරයේ දී කෑම පෙට්ටිය තියන්න තැනක් හොයද්දී ඔයා කෑම පෙට්ටිය ඇරලා බැලුවානේ, ඒ වෙලාවේ මම දැක්කා, ඒත් මම කාටවත් කිවුවේ නෑ කවීෂා කිවුවා.





ඇතියන්තම් ඔයා හොඳ වෙලාවට කාටවත් කිවුවේ නැත්තේ ''මම උදේ ඉස්කෝලේ එනකොට අපේ ගෙදර ළඟ විලේ වතුර හිඳිලා. මේ මාළු පැටියා මඩ වලේ ඉඳලා බේරගෙන මගේ කෑම පෙට්ටියේ තිබුණු කෑම ටික එතන හිටපු බල්ලෙකුට දීලා ඊට පස්සේ මම කෑම පෙට්ටිය වතුර ටිකක් දාලා මාළුවාව ඇරගෙන කෑම පෙට්ටියට දැම්මා'' කියා දෙව්හාරි කිවුවා.

කවීෂා තමන්ගේ යහළුවා කළ හොඳ වැඩේ අගය කළා. දෙව්භාරි ගෙදර ගිහිල්ලා අම්මාට මේ කතාව කිවුවා. අම්මාද තමන්ගේ දුව කළ හොඳ වැඩේ අගය කළා.





ඉන්පසු දෙව්හාරිගේ දෙමාපියන් මාළු පැටියාව ඇයගේ ගෙදර ළඟ තිබුණු පොකුණට දැම්මා.

ඊට පස්සේ හැමදාම මාළු පැටියයි, දෙව්හාරියි සතුටින් ජීවත් වුණා.

**නිමි**

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් පුජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු




මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20